# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1471 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 15/09/2024<br>පැය 1755 | | |

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.09.15 වන අද දින අළුයම් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ ශ්‍රී ආනන්දාරාම විහාරස්ථාන මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 50 ක් සන්තකයේ තබා ගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කේරළ ගංජා සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලි අඩි කඳවුර.**

2024.09.15 වන අද දින උදෑසන කාලයේදී මරදන්කේණි පොලිස් වසමේ කට්ටකාඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලි අඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාර්ග බාධක රාජකාරි යෙදී සිටියදී සැකකටයුතු කැබ් රථයක් පරීක්ෂා කිරීම සඳහා නැවැත්විමට සංඥා කිරීමේදී එම කැබ් රථය අණ නොතකා පලාගොස් ඇත.

අනතුරුව නිලධාරීන් විසින් එම කැබ් රථය පසුපස ලුහුබැඳ ගොස් ඇති අතර අදාල කැබ් රථය පලෙයි පොලිස් වසමේ සෝරම්පත්තු ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිට සඟවා තිබියදී සොයාගෙන ඇත. එම කැබ් රථයේ තිබී කේරළ ගංජා පාර්සල් 16 ක් හා අසල නිවස පරීක්ෂා කිරීමේදී තවත් කේරළ ගංජා පාර්සල් 36 ක් සොයාගෙන ඇත. ඒ අනුව මෙම පාර්සල් වල තිබූ **කේරල ගංජා කිලෝ ග්‍රෑම් 94 මිලිග්‍රෑම් 865 ක් සමඟ එම නිවසේ සිටි කාන්තාවක්** අත්අඩංගුවට ගෙන පලෙයි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 35 ක් වන පලෙයි ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

පලෙයි පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මත්ද්‍රව්‍ය සමඟ සැකරුවන් 25 දෙනෙකු අත්අඩංගුවට ගැනීම - මාතර කොට්ඨාස දූෂණ මර්දන අංශය.

2024.09.14 වන දින රාත්‍රී කාලයේ වැලිගම පොලිස් වසමේ පැලැන ප්‍රදේශයේ හෝටලයක පැවති රාත්‍රී සාදයක මත්ද්‍රව්‍ය භාවිතා කරන බවට ලද තොරතුරකට අනුව මාතර කොට්ඨාස දූෂණ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් **සිදුකර හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 51 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් 08 දෙනෙකු ,ගංජා ග්‍රෑම් 28 මිලිග්‍රෑම් 900 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් 09 දෙනෙකු සහ ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 800 ක මත්පෙති සමඟ සැකකරුවන් 08 දෙනෙකු** අත්අඩංගුවට ගෙන වැලිගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 19 ත් 38 ත් අතර වයස්වල පසු වන අහංගම, මාතර, වැලිගම, ගාල්ල, බෙලිඅත්ත, දික්වැල්ල, දෙහිවල, වැල්ලවාය, මාලිගාවත්ත, වැල්ලම්පිටිය, මාතලේ, ග්‍රෑන්ඩ්පාස් සහ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වැලිගම  පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**